**රඹෑව ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රඹෑව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය/ ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට රඹෑව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු වටිනාකම රු.943,000 ක් වූ යන්ත්‍ර වාර්ෂිකව සියයට 05 බැගින් ක්ෂය කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී සියයට 20 බැගින් ක්ෂය කිරීම නිසා යන්ත්‍ර ක්ෂය රු.141,450 ක් වැඩිවී තිබුණි. | පිළිගන්නා බව. | වත්කම් නිවැරදිව හඳුනාගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ඉදි කළ මාර්ගවල වටිනාකම රු.798,478 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂවල ගිවිසුම්ගත වී ඇති නමුත් මෙතෙක් ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති 15 කට අදාළව රු.19,236,991 ක් ණය හිමියන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ණයහිමි ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කර ඇති බව. | ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති ණයහිමියන් ලෙස හඳුනා නොගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා වන උසාවි දඩ ආදායම රු.16,716 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් තහවුරු කරන ලද 2019 වර්ෂයට අදාළව ලැබිය යුතු මුද්දර ගාස්තු රු.1,115,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාර්ග ලෙජර් ගිණුම අනුව ආරම්භක ශේෂය රු.28,805,041 ක් වු නමුත් ඊට අදාළ ක්ෂය වෙන් කිරීම් ලේඛනය අනුව ආරම්භක ශේෂය රු.73,400 ක් වුයෙන් රු.28,878,441 ක වෙනසක් විය. | පිළිගන්නා බව. | උපලේඛන අනුරූපී වාර්තා සමඟ සැසදිය යුතුය. |
| (ආ) | උපලේඛන අනුව සමාලෝචිත වර්ෂයේ දේපල පිරියත හා උපකරණ මිලදීගැනීම් රු.23,128,026 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව එය රු.37,799,021 ක් වීම නිසා රු.14,670,994 ක වෙනසක් විය. | -එම- | -එම- |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.435,841ක් වු ගිණුම් විෂයයන් 07 ක් සනාථ කර ගැනීම සඳහා විස්තරාත්මක උපලේඛන, කාල විශ්ලේෂණ හා ශේෂ සනාථන ලිපි ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගන්නා බව. | තහවුරු කිරීම් ඉදිරිපත් කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 (2) | තැන්පත් කර වර්ෂ 02ක කාලයක් ඉක්මවා තිබුණු රු.86,465 ක පොදු තැන්පත් නියාදනය කර නොතිබුණි. | පිළිගන්නා බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ වියදම රු.15,326,002 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.25,728,099 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,267,502 | 2,564,612 | 1,566,997 | 3,248,989 | 2,317,318 | 2,583,652 | 1,571,734 | 2,251,374 |
| (ii) | කුලී | 11,780,000 | 4,877,120 | 4,257,224 | 5,299,249 | 10,452,375 | 5,747,141 | 3,967,749 | 4,679,353 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,788,620 | 1,464,010 | 1,098,880 | 1,101,130 | 1,564,820 | 1,437,520 | 1,624,700 | 736,000 |
| (iv) | වෙනත් ආදායම් | 7,540,080 | 2,162,575 | 4,996,473 | 637,578 | 30,097,128 | 17,172,600 | 22,107,575 | 3,471,476 |
| | | 23,376,202 | 11,068,317 | 11,919,574 | 10,286,946 | 44,431,641 | 26,940,913 | 29,271,758 | 11,138,203 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | 2013 වර්ෂයේ තක්සේරුව පදනම්කර ගනිමින් වරිපනම් අයකරමින් පවතින අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති හිඟය රු.1,368,046 ක් විය. | හිඟ වරිපනම් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ බව. | හිඟ වරිපනම් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ii) | 2022 දෙසැම්බර් 31 වන දින වනවිට රු.2,032,890 ක ව්‍යාපාර බදු ආදායමක් අයකරගත යුතුව තිබුණි. | රු.150,000 ක මුදලක් අයකරගෙන ඇති අතර ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කර්මාන්ත බදු රු.325,300 ක් ද වෙළඳ ව්‍යාපාර බදු රු.1,728,570 ක් ද විය. | 2023 වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කළ බව. | අයකරගත් බවට තහවුරු කිරීම් ඉදිරිපත් කළ යුතුය. |
| **(ආ)** | **කුලී** | | |
| (i) | බදු දී ඇති වත්කම්වලට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට රු.572,416 ක් අයකර ගැනීමට තිබුණි. | -එම- | -එම- |
| (ii) | වාහන කුලියට ලබාදීම වෙනුවෙන් 2019 වර්ෂයේ සිට අයවිය යුතු රු.2,992,145ක් සමාලෝචිත වර්ෂයේදී ද අයකරගෙන නොතිබුණි. | මෙම හිඟ මුදල් වලින් 2020 හා 2022 වර්ෂවලට අදාළ හිඟ මුදල් රු.222,100 ක් අයකර ගැනීමට කටයුතු කර ඇති නමුත් 2019 වර්ෂයට පෙර හිඟ රු.2,060,525 ක් අයකර ගැනීමට නිශ්චිත පුද්ගලයන් හඳුනාගැනීමට නොහැකි වූ බව. | අයකර නොගැනීමට හේතු සොයාබලා එයට වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | 2020 වර්ෂය සඳහා රඹෑව සතිපොළ බදුගත් තැනැත්තාගෙන් එම වර්ෂයට අදාළව අයකරගත යුතු හිඟ බදු රු.172,500 ක් සහ 2021 වර්ෂය සඳහා රඹෑව සතිපොළ බදු ලබාගත් අයගෙන් අයවිය යුතුව ඇති රු.556,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |
| **(ඇ)** | **බලපත්‍ර ගාස්තු** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ බලපත්‍ර ගාස්තු රු.1,728,570 ක් විය. | පිළිගන්නා බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඈ)** | **වෙනත් ආදායම්** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් නිලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.758,162 ක් සහ මුද්දර ගාස්තු රු.1,753,700 ක් ලැබී නොතිබුණි. | අයකර ගැනීම සඳහා ලිපි යොමු කර ඇති බව. | ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ විමධ්‍යගත සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති 04 ක් වෙනුවෙන් රු.1,730,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු නමුත් 2022 නොවැම්බර් 03 වන දින වනවිටත් එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකර වසර 05 කට ආසන්න කාලයක් එම මුදල් කර්මාන්ත ගිණුමෙහි රඳවා තබාගෙන තිබුණි. | මෙම මුදල් වෙනත් ව්‍යාපෘතියක් සඳහා යෙදවීමට අනුමැතිය ලබාගැනීමට යොමු කර ඇති බව. | මෙම මුදල් අදාළ ව්‍යාපෘතිය සඳහා කඩිනමින් යෙදවිය යුතුය. |

### 3.2 පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සඳමල්ගම පිහිටි අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය 2015 වර්ෂයේදී ආරම්භ කර ඇතත් ඒ සඳහා පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. | මෙම අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ පිහිටි ඉඩමේ අයිතිය සභාව වෙත ලබාගැනීමෙන් පසු පරිසර බලපත්‍රය ලබාගැනීමට කටයුතු කරමින් පවතින බව. | පරිසර බලපත්‍රය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ වටිනාකම රු.7,744,000ක් වූ යන්ත්‍ර උපකරණද වටිනාකම රු.5,355,739ක් වූ ගොඩනැගිලිද තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී ප්‍රමාණවත් කාබනික පොහොර නිෂ්පාදනයක් හෝ ප්‍රතිචක්‍රීයකරණ ද්‍රව්‍ය අලෙවියක් සිදුවී නොතිබුණි. | 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේදී කාබනික පොහොර නිෂ්පාදනය සහ අලෙවිය වැඩි වී ඇති බව. | යෝජිත සැලසුම් ප්‍රකාරව ඉදිකිරීම් සිදුකර කසළ කළමනාකරණ මධ්‍යස්ථානය ප්‍රශස්ථ ලෙස පවත්වාගත යුතුය. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1994 වර්ෂයේදී මිලදීගත් 2022 දෙසැම්බර් 31 දින වනවිට සභාව සතුව පවතින වටිනාකම රු.57,000 ක්වූ සම්පූර්ණයෙන් ක්ෂය කර ලද යතුරු පැදිය භාවිතයට නොගෙන නිෂ්ක්‍රීය තත්ත්වයේ පැවතුණි. | වෙන්දේසි කිරීමට කටයුතු කරන බව. | වෙන්දේසි කිරීමට අවශය කටයුතු සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය සභාවට අයත් පැරණි පුස්තකාල ගොඩනැගිල්ල නවීකරණය කිරීමට අදාළව 2017 දෙසැම්බර් 25 දිනට නිමකරන ලද වැඩ කොටස් සඳහා රු.2,917,338 ක් ගෙවීම්කර තිබුණු නමුත් එම ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට හැකි තත්ත්වයට නිමකර නොතිබීම නිසා නිෂ්කාර්යව පැවතුණි. | ඉංජිනේරු උපදෙස් ලැබී ඇති බැවින් ප්‍රතිපාදන ලැබුණු පසු ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරමින් පවතින බව. | ඉදිකිරීම් කටයුතු ආරම්භ කර මෙම ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |
| (ඇ) | පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේදී රු.710,000 ක් වූ කසළ කැබිලි කිරීමේ යන්ත්‍රයක් සභාව වෙත ලබාදී තිබුණු නමුත් එය භාවිතයට නොගෙන නිශ්ක්‍රියව පැවතුණි. | මේ වනවිට භාවිතයට ගැනීම ආරම්භ කර ඇති බව. | උපරිම කාර්යක්ෂමතාවයෙන් භාවිතයට ගත යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් අලුතින් ඉදිකරන ලද කඩ කාමර 04 ක් සඳහා ලංසු විවෘත කරන අවස්ථාවේදී සභිකයින් වන ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන් විසින් ලංසු මිලගණන් වෙනස් කිරීමට උත්සහ දැරීම නිසා පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් මත ටෙන්ඩරය පිරිනැමීම අත්හිටුවා තිබුණි .එම නිසා නිවැරදිව ලංසු ඉදිරිපත් කළ අයට අසාධාරණයක් සිදුවී තිබුණු අතර අවම ලංසු මුදලට අනුව සභාවට මාසයකට රු.94,500 බැගින් වූ ආදායමක්ද අහිමි වී තිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් පරිදි මෙම ටෙන්ඩර් පිරිනැමීම අවලංගු කර ඇති අතර මේ නිසා සභාවට සිදුවී ඇති පාඩුව අයකර ගැනීම සඳහා උපදෙස් ලැබෙන පරිදි ක්‍රියා කරන බව. | මෙම කඩකාමර කුලියට දීමට නොහැකිවීම් නිසා සිදුවන පාඩුව එයට වගකිවයුතු පාර්ශව වලින් අයකරගත යුතුය. |

## 3.6 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 මැයි 16 දින සභාවේ කැබ්රථය අනතුරට පත්වීම සම්බන්ධයෙන් රියදුරුගෙන් අයවිය යුතු රු.94,405 ක් අයවී නොතිබුණි. | රියදුරුගෙන් රු.94,405 ක් පමණක් අයකර ගැනීමට ඇති බව. | මෙම හිඟ මුදලද අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |